# පළමුවාර පරීක්ෂණය - 2020

# 9 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01 ලෝකයේ මුළු බිම් ප්‍රමාණයෙන් ආසියා මහද්වීපයට අයත් භූමිය ප්‍රතිශතයක් ලෙෂ දැක්වූ විට

01 28 %  02 29.5 %  03 45 %  04 15 %

02 පැසිපික් සාගරයට ගලා බසින ගංගාවක් නොවන්නේ

01 ලීනා  02 හොවැංගෝ  03 අමූර්  04 යැංසිනියැං

03 ලොව වැඩිම ජන සංඛ්‍යාවක් සිටින රට වන්නේ

01 ඉන්දියාව  02 චීනය  03 ඇ.එ.ජ  04 රුසියාව

04 නිවර්ථන වර්ෂා දේශගුණය දැකිය හැකි ප්‍රදේශයකි.

01 ඉන්දියාවේ උතුරු ප්‍රදේශය  02 සෞදි අරාබිය

03 සුමාත්‍රා ජාවා දූපත්  04 ජපන් දූපත්

05 ලොව උසින්ම පිහිටි සානුව වන්නේ

01 ඩෙකෑන්  02 ටිබේට්  03 සයබීරියාව  04 මොංගෝලියාව

6 - 10 දක්වා ප්‍රශ්න වලට හරි නම් ( ) ලකුණද , වැරදි නම් ( ) ලකුණද , දී ඇති වරහන් තුල නම් ( ) ලකුණද , ලියන්න.

06 ලොව විශාලම වෙළඳ මධ්‍යස්ථානය ඩුබායි පිහිටා ඇත. ( )

07 ආසියා මහද්වීපය යුරෝපා මහද්වීපයෙන් වෙන්වන්නේ යුරල් කඳු වැටියෙනි. ( )

08 ආසියාතු කලාපයේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ වර්කොයැන්ස් ප්‍රදේශයටය. ( )

09 ලොව ගැඹුරුතම මිරිදිය විල බොල්තැෂ් විලය. ( )

10 කාර්මික ආර්ථිකයක් දැකිය හැකි රටක් වන්නේ පකිස්ථානයයි. ( )

page 1

ප්‍රශ්න අංක 11 - 15 දක්වා අදාල පිළිතුරු වරහන් තුලින් තෝරා තිත් ඉරි මත ලියන්න.

11 යම් කිසි ස්ථානයක දීර්ඝ කාලයක් තුල පවතින වායුගෝලීය ස්වභාවය නිරීක්ෂණයෙන් ලබා ගන්නා වූ නිගමනය.❑❑.................................................................................. යි.

12 ආසියාතු ප්‍රදේශයේ වැඩිම උෂ්ණත්වය දැකිය හැකි ප්‍රදේශයකි.........................................................................යි.

13 හිමාලය කඳු වැටියේ දැකිය හැකි කඳු මුදුනක් වන්නේ. .....................................................................යි.

14 ලෝකයේ විශාලතම වාරිමාර්ග පද්ධතිය හිමි රට වන්නේ....................................................................යි.

15 ජපානයේ මෝටර් රථ කර්මාන්තයකි. .........................................................යි.

( මකාලු , ටොයෝටා , දේශගුණය , කාලගුණය , සුලෙයිමාන් , ජානිකාබාද් , පකිස්ථානය , ඉන්දියාව )

16 -20 දක්වා ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

16 ආසියාතු කලාපයේ පිහිටි කඳු වැටි 2 ක් ලියන්න.

17 ආසියාවේ දැකිය හැකි කාන්තාර 2 ක් ලියන්න.

18 ආසියාවේ දිගම ගග කුමක්ද ? එහි දිග කීයද ?

19 ආසියාවේ අභ්‍යන්තර මුහුදට ගලා බසින ගංගා 2 ක් ලියන්න.

20 යුරේසියාව යනු කුමක්දැයි හඳුන්වන්න.

( ල . 2 x 20 )

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්යයවේ.**

**අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න 4 කට පිළිතුරු ලියන්න.**

( 01) ඔබට සපයා ඇති ලෝක සිතියම ආශ්‍රයෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

( i ) A B C අක්ෂර අතරින් ඉන්දු ගංගාව දැන්වෙන අක්ෂරය කුමක්ද ?

( ii ) D E F අක්ෂර අතරින් හිමාලය කඳුවැටිය දැක්වෙන අක්ෂරය කුමක්ද ?

( iii ) G H I අක්ෂර අතරින් ටිබෙට් සානුව දැක්වෙන අක්ෂරය කුමක්ද ?

( iv ) J K L අක්ෂර අතරින් මැන්චූරියා තැන්න දැක්වෙන අක්ෂරය කුමක්ද ?

( v) P Q R අක්ෂර අතරින් බයිකල් විල දැක්වෙන අක්ෂරය කුමක්ද ?

(ල . 2 x 5 )

⋆ ආසියාතු ප්‍රදේශයේ නිර්පේක්ෂ හා සාපේක්ෂ පිහිටීම ලියා දක්වන්න. (ල. 10)

02. ( i ) ආසියාව සුවිශේෂී වීමට හේතු 2 ක් ලියන්න.

( ii ) ආසියාතු කලාපයේ දැකිය හැකි වනාන්තර වර්ග 3 ක නම් කරන්න.

( iii ) එම වනාන්තර අතරින් එක් වනාන්තර වර්ගයක් පිළිබඳ විස්තර කරන්න.

03. ( i ) ආසියාවේ දැකිය හැකි ගංගා නිම්න ශිෂ්ඨාචාර 2 ක් ලියන්න.

( ii ) කොනොසොයිස් මානව වර්ගය ජීවත් වන රටවල් 3 ක් ලියන්න.

( iii ) ආසියාවේ ජනාධික රටවල් 3 ත් හා ජනහීන රටවල් 2 ක් ලියන්න.

04 ( i ) පකිස්ථානයේ ප්‍රධාන වගා කන්න 2 ක නම් කරන්න.

( ii ) එහි එක් කන්නයකදී වගා කරන බෝග වර්ග 3 ක් ලියන්න .

( iii ) පකිස්ථානය ලෝක වෙලඳපලට සපයන නිෂ්පාදන වර්ග 5 ක් ලියන්න .

05. ( i ) ආසියාවේ ප්‍රමුඛතම මෝටර් රථ නිෂ්පාදනය කරන රට නම් කරන්න .

( ii ) එහි ඇති මෝටර් රථ සමාගම් 3 ක් නම් කරන්න .

( iii ) මෝටර් රථ නිෂ්පාදනයට අමතරව එම රටේ සිදුකරන වෙනත් කාර්මික නිෂ්පාදන පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

06. ( i ) ආසියාවේ බහුලවම සේවා කර්මාන්ත දැකිය හැකි රට නම් කරන්න .

( ii ) ඔබ නම් කල රටෙහි ආර්ථිකයේ පදනම සකස් වී ඇත්තේ කුමන නිෂ්පාදන පදනම් කරගෙනද ?

( iii ) එහි දැකිය හැකි සේවා කර්මාන්ත 2 ක් නම් කරන්න.

checked checked page 3 checked checked

checked
page 4

